ක් කෑ ගහලා කට වහ ගන්න එක විතරයි.

අනාථ වන දේශපාලකයෝ

ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ ඉද හිට ලස්සන කියුම් කියන බව අපි දනිමු. අලුතින්ම කී කතාව පක්ෂයේ දොර පහසුවෙන් ඇරෙන විත්තියයි. දොරෙන් එළියට යන එක වාගේම ඇතුළට එන එකත් පහසුය. වෙනසකට ඇත්තේ පිට වෙලා යන අයට සිද්ද වෙන අහේතියයි.

ඇතුළට එන්නෝ සනාථ වන්නෝ ය. පිට වී යන්නෝ අනාථ වන්නෝ ය.

දොරේ කතාව ශ්‍රීලංනිප යට වාගේම එජාපයටත් ගැළපෙනවා ය. වෙනසකට ඇත්තේ එජාප දොර ඇරගෙන යන හැම දෙනාම අනාථ නොවීම ය. වැඩි දෙනා සනාථ වෙන එක ය.

දෙපක්ෂයේ නායකතයන් දෙන්නාට පොදු එක ලක්ෂණයක් ඇත. අනාථ වීම නොවීම කොහොම වුණත් දෙන්නාම මොනවා වුණත් පක්ෂයේ දොර ඇරගෙන පිට වෙනවා තබා සිහිතෙන් වත් ඒ ගැන හිතා නැත. මහින්ද රාජපක්ෂට පක්ෂය තුළ රජකුට වාගේ සැලකිලි ය. ඔහු පන්නා ගන්නට හිතන කෙනෙක් නැත. රනිල් වික්‍රමසිංහ පන්නා ගන්නට සමාන තරමටම කතා කරන අයත් ඇත . හැබැයි කොච්චර කතා කළත් ලොක්කා හෙල්ලෙන්නේ නැත. කතා කාරයන්ගේ කට රිදෙනවා විතර ය. ටික දොහ-

නිරීක්ෂණයක් පදනමින් මේ කාලමන පෙන ගිය දේශපාලන වශයෙන් බැරෑරුම් වූත් බොහෙවින් අරුත්බර වූත් තත්වාවබෝධයක් මේ කතාව ඔස්සේ ලබා ගත හැකි ය. ඒ තත්වය අපේ මව්බිමේ දේශපාලන ඉතිහාසය පිළිබඳව විග්‍රහයකට ද මග පාදන බව කිව යුතු ය.

දොර ඇරගෙන පක්ෂය කඩා බිඳගෙන පිට වෙච්ච පළමුවන ශ්‍රී ලාංකිකයා නිව්චියටම කියන්නට බැරි ය. මට මතක් වන පළමු චරිතය ඇහැලේපොල ය. ඔහු ගියේ පස්සා දොරෙන් ය. එසේම ලොකු බලාපොරොත්තු හිතේ දරාගෙන ය. සුද්දාගේ පිහිටෙන් සිංහල රජකම අල්ලා ගන්නට හිතාගෙන කන්ද උඩරටෙන් පලා ගිය ඇහැලේපොල අන්තිම කාලය ගත කළේ ඉන්දියා-නු සාගරයේ පුංචි දිවයිනකට කොටු වෙලා ය.

නිදහස් ශ්‍රී ලංකාවේ පක්ෂයේ දොර ඇරගෙන පිට වී ගොස් අනාථ නොවූ ලොකුම වීරයා වශයෙන් ඉතිහාස ගතව ඇත්තේ ඇස් ඩබ් ආර් ඩී බණ්ඩාරනායක මහතා ය. ඔහු පිටව ගියේ නිකම්ම නොවේ. කෝන්තරයක් පිරිමහ ගන්නට නොවේ. ඉදිරිය බලා - ඉදිරි ගමන පිළිබඳ අවබෝධයක් හා ක්‍රියා මාර්ගයක් ද ඇතිවය. ඔහු සිය ශක්තිය තක්සේරු කළා පමණක් නොවේ රටේ තත්වයත් අනාගත ප්‍රවණතාවත් මැන බැලීමට හැකියාවක් ඔහුට තිබුණේ ය. ඒ සියල්ලටම වඩා ජනතා සිතුම් පැතුම් ගැන තේරුමක් ඇතිව ජනතාව තමා වෙතට අද ගන්නට - ජනතාව තමා වටා රොක් කර ගන්නට ඇති ඉඩ කඩ හා උපාය ගැන ද පැහැදිළි තේරුමක් ඇතිවය. ගමිසහා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය ඔස්සේ ඒවාට අයත් වන පොදු ජනතාව ඇතුළත් වන පංච මහා බලවේගයක් නිශ්චය කර ගැනීම ඒ සැරසීමේ නොහොත් උපාය මාර්ගයේ මූලික ලක්ෂණය විය.

බෞද්ධ ජනතාවගේ බලාපොරොත්තු කඩවීම් ඔවුන්ට අත්විඳින්නට සිදු වූ හිරිහැර පීඩා නිසා ඔවුන් පුබුදුවා ලීමේ ඉඩ කඩ ද දැන ගැනීමට බණ්ඩාරනායක සමත් විය. ජෝන් කොතලාවල ගේ බූරු දිවයින් ප්‍රකාශය අනුව ඉස්මතුවූ සිංහල භාෂා ප්‍රේමීන්ගේ ඝෝෂාවද තමාගේ වාසියට හරවා ගැනීමට ඔහු සමත් විය. අද දින පවා ඒ අවස්ථාවාදී ක්‍රියාමාර්ගයේ ආදීනව රටට විඳින්නට සිදුවීම එකකි. එසේ බලය අල්ලා ගැනීම් වස් ගායනා කළ යුතු විසඳුම ඔහු දැන ගත්තේ ය. අල්ලන්නට ඕනෑ අඩව්වද තේරුම් ගත්තේ ය.

ඒ සියලු උපාය මාර්ග සමග තමාගේ පුද්ගල ආකර්ෂණයද යොදා ගත හැකි බව දුටු නිසා ජනතා යුගයේ නිර්මාතෘ වශයෙන් ඉතිහාස ගතවීමට සොලමන් බණ්ඩාරනායක සමත් විය.

ඊට පස්සේ පක්ෂයේ දොර කඩාගෙන පිටව යන අය වැඩි දෙනා ගියේ කෝපයට - කෝ-න්තරයට මුල් තැන දෙමින් ය. කාවකාලික ජනතා උනන්දුවක් නිසා තමන්ට මුළු රටම හොල්ලන්නට පුළුවන් වෙය යන වැරදි නිගමනය නොහොත් අපේක්ෂාව සහිතව පිටව ගිය අයට වුණේ මොකක්ද?

පිලිප් ගුණවර්ධන බණ්ඩාරනායක රජයෙන් පිට වූ දවසේ ප්‍රයිස් පාක් පිටිටතියේ පැවැත්වුණ මහා සභාව මට මතකය. එදා කථිකයන්ගේ උද්වේගකර ප්‍රකාශයන් අසා ගෙන අත් පොපනස් දුන් අය අතර මමත් සිටියෙමි. ඒ උණුසුම - උද්‍යෝගය - කලක් තිබී හෙමිහිට වියැකී ගියේ ය. පිලිප් ගුණවර්ධනට ඇමතිකමක් ගන්නට ඩඩ්ලි සේනානායකට හේතු වන්නට සිදුවිය. ඔහුගේ දේශපාලනය අවසන් වුණේ ජීවිත කාලයක් දේශපාලන

දැන් එහෙම සල්ලි දුන්නාට කිසි දෙයක් කරගන්නට බැරි ය.

එදා පනස්දාහේ කුට්ටිය බලාගෙන සී පී සමග ගිය තවත් කෙනෙකි මහාතාම සමරවීර. ඔහුගේ පුත්‍රයා මංගල සමරවීර, චන්ද්‍රිකා කුමාරතුංග බලයට පත්කිරීමට උපරිම උත්සාහ දැරුවෙකි. ඉන් පසුව මහින්ද රාජපක්ෂ දිනවීමටත් ඔහු සැබැවින් ම සුවිශේෂ මෙහෙවරක් ඉටු කළ බව පෙනෙයි. ඔහු මහින්ද රාජපක්ෂ සමග විරසක



බෞද්ධ තොරතුරු පරික්ෂණ සභා වාර්තාව පිටවීම ද ඔහු ඉදිරියේ මතු වූ තවත් සුබ නිමිත්තක් විය. එම වාර්තාව මගින් අනාවරණය කරන ලද සාමාන්‍ය

සතුරකු වශයෙන් හෙළා දුටු ඇමති තරනතුරක් දරමින් ය.

ඊට පසු අවදියක පිලිප් ගේ සගයා ආචාර්ය එන් එම් පෙරේරා දොර ඇරගෙන සිරිමා රජයෙන් පිට වී මැතිනිය මට්ටු කිරීමේ මහා ව්‍යාපාරයක් ආරම්භ කළේ ය. 1997 මහමැතිවරණයේදී මැතිනිය පරාජය වූයේ ආසන ගණන අඩු වීම නිසා ය. එන් එම් පෙරේරා ඇතුළු ලසසපයේ සියලු දෙනාම පරාජය වූහ. ලසසපය දේශපාලන භූමියෙන් අතු ගෑවී ගියේ ඒ මැතිවරණයෙන් පසුව ය. දැන් ඔවුන්ට මැති ඇමතිකම් ලැබෙන්නේ පිනට දෙන දීමනා වශයෙනි.

පක්ෂයේ දොර ඇරගෙන - හරියටම කියතොත් හොඳට ඇරලා තියෙන දොරෙන් - ඇතුළට ආ උදවියගේ කරල පැහුණු ආකාරය ප්‍රදර්ශනය වූයේ මෑත භාගයේ ශ්‍රී ලංනිප රජයට බැඳුණ එජාප දේශපාලකයන් නිසා ය. වතාවක් ශ්‍රීලංනිප යේ දොර කඩාගෙන පිටවූ එස් බී දිසානායක එජාපයේ නායකත්වය ලබන්නට තරම් මුදුනට කිට්ටු වී සිටියේ ය. එහෙත් එය හුදු සිහිනයක් බව පෙනෙන්නට වූ කල්හි ජනාධිපතිතුමා ඔහු බැහැදැකින්නට ගියේ ය. නැවත පරණ පක්ෂයේ දොරෙන් ඇතුළට එන්නට ඔහුට සිතක් ආවේ ඉන් පසුව ය.

පරණ පාක්ෂිකයා පමණක් නොවේ. කිසි දිනෙක ශ්‍රීලංනිපයට සිතින් වත් නොආ ලක්ෂ්මන් සෙනෙවිරත්න ගාමිණී ලොකුගේ බී දයාරත්න ආදී බොහෝ දෙනෙක් පෙරහැරෙන් අවුත් ශ්‍රීලංනිප දොරෙන් ඇතුළට පිය මැන්න පමණින් ඔවුන්ට ඇමතිකම් පවා පිරිනමන ලදී . කීයෙන් කීදෙනෙකුට දහසින් බැඳි පියලි ලැබුණා ද යන්න එළිපිට දැන ගන්නට බැරි ය. දුන්නා නම් දහසින් ගණන් බලන්නට බැරිය. කෝටි ගණනින් ගණින්ට සිදීද වෙනවා ය. එහෙත් සල්ලි නැතත් ඇමති කමක් සමග ලැබෙන අනෙකුත් වරප්‍රසාද ලැබීම විපක්ෂයේ ආසන රත් කරනවාට වඩා කොයි තරම් සැප පහසු වැඩක් ද?

නමසිය හැට හතරේදී ශ්‍රීලංනිප දොර කඩා ගෙන ගිය සී පී ද සිල්වා ප්‍රමුඛ පිරිසක් එජාපයට ගියෝ ය. ඔවුන් බොහෝ දෙනාට ඇමතිකම් පවා හිමිවිය. එදා නම් එසේ පිට වූ එක් මන්ත්‍රිවරයකුට ගෙවන ලද මුදල පැහැදිළිවම ප්‍රකාශ විය. රුපියල් පනස් දාහයි.

වූයේ ඇයිද යන්න මම නොදනිමි. ඔහු ශ්‍රීලංනිපයේ දොර කඩාගෙන පිට වූයේ මහින්ද රාජපක්ෂ මට්ටු කරන චේතනාවෙනි. අද පවා කතා කරන්නේ ජනාධිපතිවරයා සමතලා කර දමන්ට යනවා වාගේ ය.

කේන්තියට පිටවී යනකොට තමාගේ සවිය ගැන සතුරාගේ බලය ගැන - නිනවුවක් නොතිබීම නිසා - මංගල සමරවීර අද අතරමංව සිටින බව පෙනෙයි. මහින්ද රාජපක්ෂ ගේ කතාව මංගල සමරවීර ගැන හොඳටම සැබෑ වන බවද පෙනෙයි.

දොරෙන් පිට වී ගිය අය අතුරින් වත්මන් ශ්‍රී ලංකා දේශපාලන පිටියේ සිටින ඉතාමත්ම අවාසනාවන්ත නායකයා කරු ජයසූරිය බව කියමි. ඔහු එජාප දොර ඇරගෙන ශ්‍රීලංනිප දො-රෙන් ඇතුළු වීම පවා ඔහුගේ අනාගතයට හිතකර වුවක් නොවිය. එජාපයේ නායකයා බවට පත්වීමේ සකළවිධ සුදුසුකම් සහිත අවංක නායකයකු ලෙසින් මුළු රටම පිළිගත් මේ දේශපාලකයා ඒ තැනට පැමිණියේ නම් පක්ෂයට අඳට වඩා ජාතික හා ආගමික වශයෙන් ජනතාවට සමීප වන්නට ඉඩ තිබුණේ ය.

ශ්‍රී ලංකා කළමනාකරණ ක්ෂෙත්‍රයේ සම්මානයට පාත්‍ර වූ චරිතයක් වශයෙන් දේශපාලනයට පිවිස කොළඹ මහ නගර සභාවේ පුරපති වශයෙන් ද වටිනා මෙහෙවරක් ඉටු කොට පක්ෂ විපක් දෙගොඩටම අයත් පොදු මහජනතාව විසින් ගරු සරු දක්වන ලද මෙබඳු දේශපාලකයකු අනුචිත අවස්ථාවකදී දොරින් පිටවීම නිසා අඳ අතරමංව සිටියි. එය කනගාටුදායකය.

තමන්ට කරගන්නට බැරි දේ ඉටු කර ගනුවස් කරු ජයසූරිය ඉස්සරහට දමා ගන්නට පුද්ගලයන් තැත්කරනා හැටි පෙනතත් මේ දේශපාලකයා විසින්ම තමාට හිමිවිය යුතු ඉහළ මට්ටම හා නායකත්වය නැති කර ගත්තකු බවට දැනටමත් පත්ව සිටියි.

එය ශ්‍රී ලාංකික දේශපාලන ක්ෂේත්‍රයට අහිතකර තත්වයක් බව අවධාරණය කළ යුතු ය.

ජපුර ආදි උපාදිධාරීන්ගේ සංගමය
සංවිධානය කළ සම්මන්ත්‍රණය

ජ'පුර විද්‍යාර්තිකයින්ගේ ආදි උපාදිධාරීන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ ආයෝජන මාර්ග නමැති සම්මන්ත්‍රණය සැප්තැම්බර් 9 වෙනිදා ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ගරු අජිත් නිවාඩ් කබ්රාල් මැතිතුමගේ

සභාපති ප්‍රනාන්ත් ගලගෙදර

මහ බැංකුවේ අධිපති ගරු අජිත් නිවාඩ් කබ්රාල් මහතා සභාභාගි වූ ආරාධිතයන් සමග

සහභාගීත්වයෙන් හිල්ටන් හෝටලයේදී පවත් වන ලදී.

ජ'පුර ශිෂ්‍යත්ව අරමුදල සඳහා අධාර පිණිස පවත්වන ලද එම සම්මන්ත්‍රණය සඳහා ශ්‍රී ලාංකික ව්‍යාපාර ප්‍රජාව විශාල ප්‍රමාණයෙන් සහභාගි වූ අතර පැමිණි සිටිය පිරිස මහ බැංකුවේ අධිපති තුමා සමග සුහදව තම ගැටලු සහ අදහස් හුවමාරු කර ගත්තා.

ජ'පුර ශිෂ්‍යත්ව අරමුදල හසුන්වා දෙමින් කථාකල ජයමිණි කාරියවසම්

සහභාගි වූ විශේෂ පුද්ගලයන් අතර බටහිර ගායක ඇල්ස්ටන් කොක් මහතා ශ්‍රී ලංකාවේ මෙල්බර්න් කොන්සෝල් බන්දු දිසානායක මහතා සහ රොහාන් කබ්රාල් මහතා ඇතුලත් වූ අතර සම්මන්ත්‍රණයට සහභාගි වූ අය හිල්ටන් හෝටලයේ රාත්‍රී භෝජන සංග්‍රහයකටද සහභාගි වූහ.

විශේෂ ස්තූතිය

ජනන් ජේ. එදිරිසිංහ මහතා ඇතුලු සන්නස පිරිවර
හිමල් අල්විස් ඇතුලු ශ්‍රී ලංකා මෝතින් ෂෝ පිරිවර
සහභාගි වූ ආරාධිතයන් සියලු දෙනාටම